ලංසු කැඳවීමේ ආරාධනාවයි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් කර ඇති සේවාවන් සැපයීමට යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

වගුව අංක **01**

	කොන්ත්‍රාත්තුවේ නම සහ කොන්ත්‍රාත් අංකය	ලංසු වලංගු කාලය	ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව (රු.)	ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.)	ලංසු සුරක්ෂණයේ වලංගු කාලය	පූර්ව ලංසු රැස්වීම්
01	**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කලාප A සඳහා පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවය සහ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවය සැපයීම** 2026-2027 **කොන්ත්‍රාත් අංක -** USJP/EIS/CL/ZA/2026-2027	2027.02.04	20,000.00	1,200,000.00	2027.03.20	2027.11.11 පෙ.ව.10.30.
02	**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කලාප B සඳහා පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවය සැපයීම** 2026-2027 **කොන්ත්‍රාත් අංක -** USJP/EIS/CL/ZB/2026-2027	2027.02.04	11,500.00	460,000.00	2027.03.20	2027.11.11 පෙ.ව.10.30.
03	**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කලාප C සඳහා පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවය සැපයීම** 2026-2027 **කොන්ත්‍රාත් අංක -** USJP/EIS/CL/ZC/2026-2027	2027.02.04	7,000.00	251,000.00	2027.03.20	2027.11.11 පෙ.ව.10.30.
	ඉහත සඳහන් කොන්ත්‍රාත්තු සඳහා, තෝරාගනු ලබන සේවා සපයන්නන් රට තුළ ක්‍රියාත්මක වන කම්කරු නීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. **සටහන:** විශ්වවිද්‍යාලයේ පිරිසිදු කිරීමේ කලාප තුනක් (Zone A, Zone B සහ Zone C ලෙස හඳුනාගෙන ඇති) සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ලංසුකරුවන්ට අවසර ඇත. කාර්යක්ෂම කළමනාකරණයක් සහතික කිරීම සහ මෙහෙයුම්මය අභියෝග අවම කර ගැනීම සඳහා, එක් කොන්ත්‍රාත්කරුවෙකුට උපරිම වශයෙන් කලාප දෙකක් සඳහා පමණක් කොන්ත්‍රාත්තු පිරිනමනු ලැබේ.					
04	**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගලි බවුසර් සේවාව සැපයීම 2027** **කොන්ත්‍රාත් අංක -** USJP/EIS/GBS/2027	2027.02.04	7,000.00	255,000.00	2027.03.20	2027.11.11 ප.ව.02.30.
	සටහන: අපජලය බැහැරකිරීමට අදාල අධිකාරියක් විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇති ලංසුකරුවන් මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබයි.					

2. කොන්ත්‍රාත් කාල සීමාව දින 365 කි.

3. ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටියට අනුව ලංසු කැඳවීම සිදු කෙරේ.

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර තොරතුරු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (තොරතුරු හා සේවා) වෙතින් දුරකතන අංක 011-2802856 මඟින් ලබා ගත හැකි අතර, සතියේ වැඩ කරන දිනයන්හි දී පහත සඳහන් කර ඇති ලිපිනයේ **දී 2026 නොවැම්බර් 04 දින සිට 2026 නොවැම්බර් 18** දින දක්වා **පෙ.ව. 09.00 සිට ප.ව. 04.15** දක්වා ලංසු පත්‍ර පරීක්ෂා කර බැලිය හැක.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන් **දී 2026 නොවැම්බර් 04 දින සිට 2026 නොවැම්බර් 18** දින දක්වා කාලය තුළ කාර්යාල වේලාවෙන් **පෙ.ව. 09.00 සිට ප.ව. 02.30** දක්වා ඉහත වගු අංක 01 හි සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව විශ්වවිද්‍යාලය වෙත තැන්පත් කර, එම රිසිට් පතෙහි පිටපතක් සමඟ ලිඛිත අයදුම්පතක් පහත සඳහන් ලිපිනය වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු පත්‍ර ලබා ගත හැක. ගෙවීම්, විශ්වවිද්‍යාලයේ සරප් කවුන්ටරය වෙත මුදලින් තැන්පත් කළ හැක.

6. පූර්ව ලංසු රැස්වීම් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැඟිල්ලේ පිහිටි මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී වගු අංක 01 හි සඳහන් පරිදි පැවැත්වේ.

7. **2026 නොවැම්බර් මස 19** දින **ප.ව 02.30** ට පරිපාලන ගොඩනැඟිල්ලේ මාණ්ඩලික රැස්වීම් ශාලාවේ දී, මුද්‍රා තබන ලද ලංසු භාර ගැනීම අවසන් කරනු ලැබේ. ලංසු භාර ගැනීම සඳහා වන වේලාව අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ බලයලත් නියෝජිතයන්ට (එක් ලංසුකරුවෙකුට එක් නියෝජිතයෙකු බැගින්) ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි විය හැක.

8. ලංසු බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලංසුවේ නම හා ලංසු විවෘත කරන දිනය හා වේලාව සඳහන් කළ යුතුය. මුද්‍රා තබන ලද ලංසු පත්‍රිකා, ලංසු භාර ගැනීම අවසන් වන දින වන **2026 නොවැම්බර් මස 19** දින **ප.ව. 02.30** ට පෙර ලැබෙන පරිදි නුගේගොඩ, ගංගොඩවිල පිහිටි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී/ ආයතන (තොරතුරු හා සේවා) වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීම හෝ ඉහත කී කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියෙහි තැන්පත් කිරීම සිදු කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කර ඒවා විවෘත නොකරම ආපසු ලංසුකරුවන් වෙත යවනු ලැබේ.

9. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අවසාන තීරණය ගනු ලැබේ.

10. එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ලංසු වලංගු කාලය වගු අංක 01 හි සඳහන් වේ.

11. ලංසු සමඟ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය උපකුලපති නමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද වාණිජ බැංකුවකින් නිකුත් කළ ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතු වේ. එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා ලබා දිය යුතු ලංසු සුරක්ෂණයේ වටිනාකම හා ලංසු සුරක්ෂණ වලංගු කාලය වගු අංක 01 හි සඳහන් වේ.

12. තෝරා ගනු ලබන සේවා සැපයුම්කරුවන් රටෙහි පවත්නා කම්කරු නීති වලට අනුගතව ක්‍රියා කල යුතු වේ.

ඉහත අවශ්‍යතා සඳහා අදාල ලිපිනයන්:

මිල කැඳවීමේ ලේඛන පරීක්ෂා කිරීම, මිල කැඳවීමේ ලේඛන ඉල්ලුම් කිරීම සහ ලංසු භාරදීම සඳහා:

සහකාර ලේඛකාධිකාරී
ආයතන (තොරතුරු හා සේවා) අංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

මිල ගණන් විවෘත කිරීම
මාණ්ඩලික රැස්වීම් ශාලාව (පරිපාලන ගොඩනැගිල්ල)
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල, නුගේගොඩ.

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
2026.10.16